පටුන

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා එප්පාවල පොස්පේට් නිධිය උපරිම ධාරිතාවයෙන් භාවිතා කිරීම ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව.

---

01. විධායක සාරාංශය

ශ්‍රී ලංකාව තුල පාෂාණ පොස්පේට් නිධි 02ක් පිහිටා ඇති අතර ආර්ථික වශයෙන් වැඩි වැදගත්කමක් ඇති පොස්පේට් නිධිය වන එප්පාවල පොස්පේට් නිධිය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එප්පාවල ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ග කිලෝමීටර් 06 ක පමණ ප්‍රදේශයක පැතිර ඇති මෙම නිධිය මෙට්‍රික් ටොන් මිලියන 60 ක පමණ ධාරිතාවයකින් යුක්ත බව හඳුනාගෙන ඇත. මෙය 1971 වර්ෂයේදී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සොයාගෙන ඇති අතර 1971-1974 කාලය තුල එය ආශ්‍රිතව මිණුම් කටයුතු සිතියම් ගත කිරීම, මිහි විදුම් සිදුකිරීම, නියැදි රැස් කිරීම ආදිය සිදුකර ඇත. 1974 වර්ෂයේදී දිස්ත්‍රික් සංවර්ධන කවුන්සලය විසින් සුළු පරිමාණ කැණීම් අරඹා ඇති අතර 1978 වර්ෂයේදී එම කටයුත්ත රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාව වෙත පවරා ඇත. 1992 වර්ෂයේදී සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම පිහිටුවීමෙන් පසු එහි කැණීම් කටයුතු එකී සමාගම විසින් කරගෙන යනු ලැබේ. කෙසේ වුවත් මෙම නිධිය සොයාගෙන වර්ෂ 46 ක් ඉක්ම ගොස් ඇතත් එය රටේ සංවර්ධනය සඳහා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

ආනයනික ත්‍රිත්ව සුපර් පොස්පේට්වලට (Triple Super Phosphate) ආදේශකයක් ලෙස යොදාගත හැකි කේවල සුපර් පොස්පේට් (Single Super Phosphate) නිපදවීම සඳහා මෙම නිධිය ප්‍රයෝජනයට ගත හැකි බව විවිධ බුද්ධිමතුන් පර්යේෂණ වලින් අනාවරණය කරගෙන ඇති අතර සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම, කෘෂිකර්ම අමාත්‍යාංශය හා අමාත්‍ය මණ්ඩලය විසින් විවිධ අවස්ථාවලදී කේවල සුපර් පොස්පේට් (Single Super Phosphate) නිපදවීමට තීරණ ගෙන ඇතත් එකී තීරණ අද දක්වාම ක්‍රියාත්මක කර නැත.

ත්‍රිත්ව සුපර් පොස්පේට් (Triple Super Phosphate) වලට ආදේශකයක් ලෙස එප්පාවල කේවල සුපර් පොස්පේට් (Eppawala Single Super Phosphate) නිෂ්පාදනය ආරම්භ කලහොත් ත්‍රිත්ව සුපර් පොස්පේට් (Triple Super Phosphate) ආනයනය සඳහා වැයවන විදේශ විනිමය ඉතිරි වන අතර අතිරික්ත නිෂ්පාදනය අපනයනය කිරීමෙන් විදේශ විනිමය ඉපැයීමටද හැකිවේ. එසේම එප්පාවල පොස්පේට්වල කැඩ්මියම් සහ ආසනික් ඉතාමත් ස්වල්ප ප්‍රමාණයක් ඇති නිසා දැනට ව්‍යසනයක්ව පවතින වකුගඩු රෝගය මෙන්ම පිළිකා හා හෘදයාබාධද අවම කරගත හැකි අතර වන බවද අනාවරණය වී ඇත. තවද කේවල සුපර් පොස්පේට් (Single Super Phosphate) නිෂ්පාදනය හා නිෂ්පාදන විවිධාංගිකරණයට යොමු වීම තුලින් සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු බවත් නිරීක්ෂණය විය.

02. වාර්තාවේ පසුබිම හා ස්වාභාවය

ආර්ථික වැදගත්කමකින් යුක්ත ස්වභාවික සම්පතක් වන එප්පාවල පොස්පේට් නිධිය ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම පිළිබඳව රජය, සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම, දේශපාලන පක්ෂ, විවිධ බුද්ධිමතුන්, පරිසරවේදීන්, ප්‍රදේශවාසීන් හා මාධ්‍ය වේදීන්ගේ අවධානයට ලක්වී ඇත. තවද විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ජාතික විද්‍යා පදනම විසින් එප්පාවල පොස්පේට් නිධියේ පිහිටීම, එයින් නිපදවිය හැකි පොහොර සහ එම නිධිය ප්‍රයෝජනයට ගෙන දේශීය කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය පොහොර නිපදවා ගැනීම සහ එම පොහොරවල සාරවත්භාවය පිළිබඳව දිගින් දිගටම විවිධ අත්හදා බැලීම් සිදුකර වාර්තා සකස්කර තිබුණි. එසේ වුවද 1971 වර්ෂයේ දී හඳුනාගත් මෙම පොස්පේට් නිධිය 2018 වර්ෂය අවසාන වන විටද රටේ සංවර්ධනයට යොදා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට ඉහත සඳහන් කරන ලද පාර්ශවයන්ට නොහැකි වී ඇත. එබැවින් පාරිසරික හා සමාජයීය ගැටළු අවම වන පරිදි පොස්පේට් නිධිය ආර්ථික වශයෙන් ඵලදායි ලෙස යොදාගැනීමට පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීම මෙම විශේෂ වාර්තාවෙන් අපේක්ෂා කෙරේ.

03. වාර්තාව පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී පහත දැක්වෙන ක්‍රමවේදයන් අනුගමනය කරන ලදි.

3.1 ලේඛන පරීක්ෂා කිරීමෙන් තොරතුරු රැස්කිරීම

3.1.1 සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ (LPL) සාංගමික ව්‍යවස්ථාවලිය.

3.1.2 සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ (LPL) සංස්ථාපන සහතිකය.

3.1.3 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත.

3.1.4 Preliminary project proposal for the manufacture of SSP Fertilizer using local phosphate Rock - Lanka phosphate Ltd.

3.1.5 Sri Lanka standard Specification for rock phosphate

3.1.6 කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් නිකුත්කරන ලද "කෘෂි තාක්ෂණ" සඟරාව

3.1.7 Project proposal for manufacture of SSP - Lanka phosphate Ltd.

3.1.8 Market survey for Eppawala SSP Fertilizer - Lanka phosphate Ltd.

3.1.9 Manufacture of coconut Fertilizer - Lanka phosphate Ltd.

3.1.10 Research findings on ESSP Fertilizer - Lanka phosphate Ltd & Agriculture Department.

3.1.11 2008 වර්ෂයේදී සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම **(LPL)** විසින් මධ්‍යම පරිසර අධිකාරිය **(CEA)** වෙත ඉදිරිපත්කර ඇති පාරිසරික තත්ත්ව බලපෑම පිළිබඳ ඇගයීම් වාර්තාව.

3.1.12 ජාතික විද්‍යා පදනම **(NSF)** මඟින් ප්‍රසිද්ධ කර ඇති පර්යේෂණ වාර්තා.

3.1.13 මහ බැංකු වාර්තා.

3.1.14 මේ සම්බන්ධයෙන් නිකුත් ඇති විගණන විමසුම්

3.2 අනෙකුත් පරීක්ෂා කිරීම්

3.2.1 අන්තර්ජාලය පිරික්සීමෙන් තොරතුරු ලබාගැනීම.

3.2.2 සබරගමුව විශ්ව විද්‍යාලයේ භිටපු උප කුලපති මහාචාර්ය චන්දන.පී.උඩවත්ත මහතාගෙන් සහ රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය චන්න ජයසුමන මහතාගෙන් විශේෂඥ සහය ලබා ගැනීම.

3.2.3 සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ **(LPL)** සභාපති සහ සාමාන්‍යාධිකාරි ඇතුළු ඉහල කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීම.

3.2.4 පොස්පේට් නිධිය හා පොස්පේට් සමාගමේ නිෂ්පාදන ස්ථානයන් නිරීක්ෂණය කිරීම.

04. විගණන විෂය පථය

ආනයනික ත්‍රිත්ව සුපර් පොස්පේට්වලට **(Triple Supper Phosphate)** ආදේශකයක් වශයෙන් කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිපදවීමේ අවශ්‍යතාවයත්, දිගුකාලීන වගාවන් සඳහා පොහොර අවශ්‍යතාවය සඳහා නිපදවීම සඳහා එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ථ ආකාරයෙන් භාවිතා කිරීම, එම පොහොර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කිරීමේ හැකියාවක්, එහි අවශ්‍යතාවය හා වැදගත්කම පරීක්ෂා කිරීම සිදු කරන ලදී.

05. විගණන විෂය පථයේ සීමාවන්

5.1 සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ **(LPL)** එප්පාවල ප්‍රධාන කාර්යාලයට ගිනි හානි සිදුවීම හේතුවෙන් ඇතැම් වැදගත් ලේඛන විනාශවීම හේතුවෙන් එම ලේඛන විගණනය සඳහා උපයෝගී කරගත නොහැකි වීම.

5.2 විගණනයේ සෘජු නිරීක්ෂණයන්ට අමතරව වෙනත් බාහිර වෘත්තීමය ගවේෂණ වාර්තාවන්ද අදාල කර ගැනීම හේතුවෙන් එවන් බාහිර වාර්තාවල නිරීක්ෂණ මත පදනම්ව කටයුතු කිරීමට සිදු වීම.

06. ක්‍රියාවලිය

6.1 එප්පාවල පොස්පේට් නිධිය පිළිබඳ හැඳින්වීම

6.1.1 එප්පාවල පොස්පේට් නිධිය පිහිටීම හා සොයා ගැනීම

6.1.1.1 භූ විද්‍යා හා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 1971 වර්ෂයේදී පාෂාණ පොස්පේට් නිධි 02 ක් එප්පාවල හා කවිසිගමුව ප්‍රදේශ වලින් සොයා ගෙන තිබුණි. ඉන් ආර්ථික වටිනාකමකින් යුත් විශාලතම නිධිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එප්පාවල ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම පොස්පේට් තැන්පතුව (නිධිය) වර්ග කිලෝමීටර 06 ක පමණ භූමි භාගයක පැතිර ඇති බවත් එය ඉතා සුපරික්ෂාකාරීව අධ්‍යයනයේදී උතුරු නිධිය හා දකුණු නිධිය වශයෙන් කොටස් දෙකකට (02) හඳුනාගත හැකි බවත්, උතුරු හා දකුණු නිධිවල පිළිවෙලින් මෙට්‍රික් ටොන් මිලියන 40 ක සහ මෙට්‍රික් ටොන් මිලියන 20 ක පමණ වන සංචිත ප්‍රමාණයකින් යුක්ත බවට විවිධ පරීක්ෂණ වාර්තා අනාවරණය කරයි. (ඇමුණුම 01)

6.1.1.2 තවද මිහි විදමන් දත්තයන්ට (bore – hole sampling data) අනුව සංචිතයෙන් සියයට 35 ක පමණ ප්‍රමාණයක් භූමි මට්ටමින් එනම් අඩි 400 ක සමෝච්ච රේඛාවට ඉහලින් පිහිටා ඇති අතර ඒ අනුව උතුරු නිධියේ මෙට්‍රික් ටොන් මිලියන 14 ක් සහ දකුණු නිධියේ මෙට්‍රික් ටොන් මිලියන 07 ක් පමණ භූමි මට්ටමට ඉහලින් පිහිටා තිබේ.

6.1.1.3 පොස්පේට් අමුද්‍රව්‍යයක් ලෙස දිගුකාලීන හා කෙටිකාලීන භෝග සඳහා අවශ්‍ය පොහොර නිෂ්පාදනය, සත්ත්ව ආහාර නිෂ්පාදනය, ජල මෘදුකාරක ද්‍රව්‍ය නිපදවීම, විවිධ රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය, කෘතිම අස්ථි නිෂ්පාදනය, පිහන් භාණ්ඩ නිෂ්පාදනය, ඖෂධ නිෂ්පාදනය, තීන්ත වර්ග නිෂ්පාදනය සඳහා යොදා ගත හැකිබව හඳුනාගෙන ඇත.

6.2 එප්පාවල පොස්පේට් නිධියේ සුවිශේෂිතාවය

6.2.1 එප්පාවල පොසේපේට් නිධිය ඇපටයිට් (Apatite) යන ඛණිජ නාමයෙන් හඳුන්වනු ලබන අතර, මෙහි සාමාන්‍ය පොස්පරස් සියයට 33 සිට සියයට 40 දක්වා ප්‍රමාණයක් අන්තර්ගත වේ. මෙම පොස්පේට් නිධිය අනෙක් රටවල පිහිටි මෙවැනි නිධිවලට වඩා සුවිශේෂී වනුයේ සාමාන්‍යයෙන් පොස්පේට්වල අඩංගු කැඩ්මියම් (Cd) හා ආසනික් (As) මෙම නිධියේ නොසැලකිය යුතු මට්ටමක පවතින බව හඳුනාගෙන තිබීමයි. එනම් බංගලාදේශයේ පිහිටා ඇති අන්තර් ජාතික පොහොර සංවර්ධන සංස්ථාව (International Fertilizer Development Corporation) මඟින් හඳුනාගෙන ඇති ආකාරයට මෙහි කැඩ්මියම් සංයුතිය 0.0005% ක් වේ (ඇමුණුම 02).

6.2.2 තවද වකුගඩු රෝගයට ප්‍රබල ලෙස බලපාන බවට හඳුනාගෙන ඇති කැඩ්මියම් හා ආසනික් ආනයනික රසායනික පොහොරවලවල විශාල වශයෙන් අඩංගු වුවත් එප්පාවල පොස්පේට් වල

එම රසායනිකය ඉතාමත් අල්ප වශයෙන් ඇතුලත් බව සී/ස ලංකා පොස්පේට් සමාගම (LPL) විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට යොමුකර ඇති කේවල සුපර් පොස්පේට් (Single Supper Phosphate) නිපදවීමේ ව්‍යාපෘති වාර්තාව මගින් සනාථ කර ඇත. එසේම එම වාර්තාවෙන් පැහැදිලි කරන ආකාරයට මෙම නිධිය ලෝකයේ තිබෙන හොඳම පොස්පේට් නිධි 10 ටද ඇතුලත් වේ. (ඇමුණුම 02)

රූපසටහන 01 - පොස්පේට් නිධියෙහි පිහිටීම

6.3 සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම පිළිබඳ හැඳින්වීම

6.3.1 සමාගම පිහිටුවීම

1982 අංක 17 දරන සමාගම් පනත මඟින් 1992 ජූලි 10 දින සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම පිහිටුවන ලදී.

6.3.2 සමාගමේ දැක්ම

එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කරගනිමින් පෝෂ්‍යදායී පොස්පරස් මඟින් අපගේ මාතෘභූමිය සාරවත් කිරීම.

6.3.3 සමාගමේ මෙහෙවර

පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාව සැපිරීම.

6.3.4 සමාගම පිහිටුවීමේ අරමුණු

- ❖ **1957** අංක **49** දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කර, පිහිටුවන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොටසක් වන එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතියේ කාර්යයන් පවරා ගැනීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටසට අයත් සහ එමගින් පරිහරනය කරන වංචල සහ නිශ්චල දේපළ සම්බන්ධයෙන් අයිතිය ලබාගැනීම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටසේ එබඳු දේපළ සම්බන්ධයෙන් වූ බලතල, වරප්‍රසාද සහ හිමිකම් ඇතුළු සියලු අයිතිවාසිකම් ලබාගැනීම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටසට අයත් සියලු වගකීම් පවරා ගැනීම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටස සම්බන්ධයෙන් එයට අයත් සියලු පොත්, ගිණුම් සහ ලියකියවිලි භාර ගැනීම සහ පවත්වා ගෙන යාම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටසට අයත් නිලධාරීන්ට සහ සේවකයන්ට රැකියා ප්‍රදානය කිරීම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටසට අයත් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා එළඹී සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට ප්‍රවේශවීම.
- ❖ ඉහත සඳහන් කරන ලද රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවට අයත් එප්පාවල ෆොස්පේට් ව්‍යාපෘතිය වශයෙන් නම් කර ඇති කොටස මගින් හෝ එම කොටසට එරෙහිව ගන්නා ලද සියලු ක්‍රියාමාර්ග සහ පනවන ලද නඩු කටයුතු සම්බන්ධ වාර්තා ලබාගැනීම.
- ❖ ෆොස්පේට් හෝ ඒ ආශ්‍රිත අනෙකුත් ඛණිජ වර්ග කැණීම, වෙන්කිරීම, පිරිසිදු කිරීම, පිරියම් කිරීම, සැකසීම සහ පිළියෙල කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ❖ ෆොස්පේට් හෝ ඒ ආශ්‍රිත ඕනෑම සංයෝගයක හෝ එහි ව්‍යුත්පන්නයක හෝ අතුරුඵලයක් ආශ්‍රයෙන් ලබා ගන්නා ලද, වාණිජමය හෝ කර්මාන්තමය වටිනාකමක් සහිත ඕනෑම නිපැයුමක් නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම, පිරික්සුම, මිලදී ගැනීම, ගබඩා කිරීම, වෙළඳාම් කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම.

- ❖ ෆොස්පේට් හෝ ඒ ආශ්‍රිත අනෙකුත් ඛණිජ වර්ග කැණීම, වෙන්කිරීම, පිරිසිදු කිරීම, පිරියම් කිරීම, සැකසීම සහ පිළියෙල කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබිය හැකි ඕනෑම අතුරුඵලයක් පිරිසිදු කිරීම, පිරියම් කිරීම, සැකසීම, පිළියෙල කිරීම සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීම.

6.3.5 එප්පාවල පොස්පේට් නිධිය සංවර්ධනය සඳහා යොදා ගැනීමට සමාගමට ගත හැකි පියවර

6.3.5.1 එප්පාවල පොස්පේට් නිධිය සංවර්ධනය සඳහා යොදා ගැනීමට සමාගමට ගත හැකි පියවරයන් පහත දැක්වේ.

i. දිගුකාලීන භෝග සඳහා පොස්පරස් අවශ්‍යතාවය සපුරාලිය හැකි පොහොර නිෂ්පාදනය කර දේශීය අවශ්‍යතාවයන් සපුරා ගැනීම.

ii. කෙටිකාලීන භෝග සඳහා පොස්පරස් අවශ්‍යතාවය සපුරාලිය හැකි පොහොර නිෂ්පාදනය කර දේශීය අවශ්‍යතාවයන් සපුරා ගැනීම.

iii. දිගු කාලීන හා කෙටි කාලීන බෝග සඳහා පොස්පරස් අවශ්‍යතාවය සපුරාලිය හැකි පොහොර නිෂ්පාදනය කර අපනයනය කිරීම.

iv. පොස්පේට් භාවිතා කළ නිෂ්පාදනය කළ හැකි විවිධ නිෂ්පාදනයන් සිදු කිරීම

6.3.5.2 සී/ ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ වැඩබිම තුල ඇති උපකරණ භාවිතයෙන් ආනයනික සල්පියුරික් අම්ලය සහ එප්පාවල රොක් පොස්පේට් (ERP) අවශ්‍ය රසායනික ක්‍රියාවලියට භාජනය කිරීම මඟින් එප්පාවල කේවල සුපර් පොස්පේට් (Eppawala Single Supper Phosphate) නිෂ්පාදනය කල හැකි බව 2006 වර්ෂයේදී එවකට පොස්පේට් රාජ්‍ය සමාගමෙහි සභාපතිවරයා වශයෙන් කටයුතු කල මහාචාර්ය චන්දන පී. උඩවත්ත මහතාගේ මැදිහත්වීමෙන් ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම විසින්ම අත්හදා බැලීම් සිදුකර පෙන්වා දී ඇත. (ඇමුණුම 03)

රූප සටහන - 02





6.3.6 පොස්පේට් නිධිය සංවර්ධනය සඳහා යොදා ගැනීමට සමාගම සතු සම්පත්

i. ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම සතුව ප්‍රමාණවත් මානව සම්පත් පැවතීම.(ඇමුණුම 04)

ii. එප්පාවල රොක් පොස්පේට් (ERP) නිධියේ අයිතිය රාජ්‍ය ආයතන සතුවීම. (ඇමුණුම 05)

iii. ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම රජය සතුව පැවතීම හේතුවෙන් එප්පාවල කේවල සුපර් පොස්පේට් (Eppawala Single Supper Phosphate) ප්‍රවර්ධනය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතනවල සහයෝගය ලබා ගැනීමේ හැකියාව.

ඒ අනුව ඉහත සඳහන් පරිදි මානව හා භෞතික ශක්‍යතාවයන් මෙම සමාගම සතුව පැවතීම නිසා පහසුවෙන් එප්පාවල කේවල සුපර් පොස්පේට් (Eppawala Single Supper Phosphate) නිෂ්පාදනය ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමට සිදුකල හැකි බව පර්යේෂණවලින් තහවුරු කර ඇත. (ඇමුණුම 06)

6.3.7 ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ වත්මන් ක්‍රියාකාරිත්වය

6.3.7.1 කෘෂිකර්මාන්තය මත පදනම් වූ ආර්ථිකයක් පවතින ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝගයන් වන තේ, රබර්, කුළු බඩු වර්ග මෙන්ම පොල් යනාදී දිගුකාලීන භෝග සඳහා අවශ්‍ය වන පොහොර නිෂ්පාදනය සඳහා ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම විසින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආයතන 12 ක් වෙත අමුද්‍රව්‍ය සපයන අතර එකී ආයතන විසින් 1992 වර්ෂයේ සිට මේ දක්වා එකී පොහොර නිෂ්පාදනය කරමින් පවතී. එමෙන්ම 2014 වර්ෂයේදී සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම විසින් වාරියපොළ ස්ථාපිත කරන ලද පොල් පොහොර නිෂ්පාදනාගාරයේද දිගු කාලීන බෝග සඳහා යොදා ගන්නා පොහොර නිෂ්පාදනය ආරම්භ කර ඇත. 1976 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සමස්ථ පොස්පේට් නිධියෙන් මෙට්‍රික් ටොන් මිලියන 1.4 ක පමණ ප්‍රමාණයක් ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් උපයෝජනය කර ඇති බවට හඳුනාගැනීමට හැකි විය..(ඇමුණුම 07)

6.3.7.2 ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම විසින් 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අවුරුදු පහක කාලය තුලදී පමණක් පොස්පේට් මෙට්‍රික් ටොන් 276,431 ක් පෞද්ගලික සමාගම් 12 ක් වෙත අලෙවි කර තිබුණි.

වගු අංක 01 - පොස්පේට් සමාගමේ විකුණුම් 2013 -2018

ආයතනය	අලෙවි කල ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)						
	2013	**2014**	**2015**	**2016**	**2017**	**2018**	එකතුව
ඒ බවර්ස් සහ සමාගම	**18,850**	**18,450**	**19,650**	**13,450**	**15,250**	**14,665**	100,315
සී අයි සී සමාගම-කොළඹ	**10,500**	**11,500**	**12,500**	**8,500**	**9,050**	**9,470**	61,520
සී අයි සී සමාගම - කුරුණෑගල	**2,100**	**2,350**	**3,200**	**950**	**1,032**	**19,895**	29,527
හේලිස් සමාගම	**4,900**	**4,500**	**4,050**	**2,500**	**4,360**	**5,860**	26,170
එලයිඩ් සහ සමාගම	**1,975**	**1,650**	**1,800**	**1,200**	**1,335**	**1,605**	9,565
සී ඒෆ් සී සමාගම	**3,225**	**3,050**	**2,950**	**1,500**	**1,825**	**65**	12,615
ඇග්ස්ටාර් සමාගම	**3,500**	**3,900**	**5,400**	**2,650**	**3,511**	**4,401**	23,362
කොළඹ කොමර්ෂල් සමාගම	**375**	**325**	**350**	**285**	**234**	**-**	1,569
ලන්කෙම් සමාගම	**325**	**495**	**520**	**120**	**390**	**50**	1,900
ඩිමෝ සමාගම	**-**	**-**	**-**	**-**	**1,280**	**2,500**	3,780

බ්‍රවුන්ස් සහ සමාගම	-	-	-	-	-	**330**	330
ඒසියා සහ සමාගම	**1,300**	**730**	**820**	**850**	**819**	**1,258.8**	5,778
එකතුව	47,050	46,950	51,240	32,005	39,086	60,100	276,431

ඒ අනුව 2013 -2018 කාලපරිච්ඡේදය තුලදී සමාගම විසින් අලෙවි කරන ලද මුළු පොස්පේට් ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 276,431 න් සියයට 36 ක ප්‍රමාණයක් ඒ බවර්ස් සහ සමාගම වෙත අලෙවි කර තිබුණි. නමුත් 2018 වර්ෂයේදී එම සමාගම මිලදී ගත් මෙ.ටො 14,665 ක ප්‍රමාණය හා සසඳන විට සී.අයි.සී.සමාගම - කුරුණෑගල විසින් මෙ.ටො 19,895 ක ප්‍රමාණයක් මිලදී ගෙන තිබුණි.

6.3.7.3. 2014 වර්ෂයේදී ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම විසින් වාරියපොල ප්‍රදේශයේ පොල් පොහොර නිශ්පාදනාගාරයක් ස්ථාපිත කර ඇති අතර එම නිෂ්පාදනාගාරයෙහි පසුගිය වර්ෂ හතරෙහි ලාභය පහත දැක්වේ.

වගු අංක 02 පොල් පොහොර නිෂ්පාදනාගාරයෙහි ලාභය/අලාභය 2015/16 – 2018/19

වර්ෂය	2015/2016	2016/2017	2017/2018	2018/2019
පිරිවැටුම	**45,880,398**	**23,634,560**	**36,883,192**	**23,834,967**
(-) ව්‍යාපෘති වියදම	**(46,139,320)**	**(28,002,807)**	**(43,779,678)**	**(35,536,695)**
ලාභය	**(258,922)**	**(4,368,247)**	**(6,896,486)**	**(11,701,728)**

උක්ත වගුව අංක 02 හි තොරතුරු අනුව පොල් පොහොර නිශ්පාදනාගාරයෙහි ශුද්ධ අලාභය 2015/2016 හා සලකා බලන විට 2018/2019 වර්ෂයේ දී සියයට 4,519 කින් පමණ ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

6.3.7.4.ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමෙ ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රමය වන දේශීය සමාගම් වෙත අමුද්‍රව්‍ය වශයෙන් එප්පාවල රොක් පොස්පේට් (ERP), අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) හා අනෙකුත් නිෂ්පාදන අලෙවියෙන් පසුගිය වර්ෂ පහතුල උපයා ගෙන ඇති ආදායම හා ඒ සඳහා දරා ඇති වියදම් පිළිවෙළින් වගුව අංක 03 හි හා 04 හි දැක්වේ.

වගු අංක 03 - පොස්පේට් සමාගමේ අලෙවි ආදායම 2014/15 – 2018/19

ආදායම	2014/2015 (රු)	2015/2016 (රු)	2016/2017 (රු)	2017/2018 (රු)	2018/2019 (රු)	එකතුව (රු)
එප්පාවල රොක් පොස්පේට් අලෙවිය	429,697,844	424,243,777	263,439,661	360,912,445	397,972,670	1,876,266,397
අධිශ්‍රේණි එප්පාවල රොක් පොස්පේට් අලෙවිය	99,817,395	92,069,620	78,840,900	97,490,490	111,524,775	479,743,180
පොල් පොහොර අලෙවිය	520,655	46,424,398	23,813,360	29,676,203	20,837,197	121,271,813
යූරියා,එම්.ඕ.පී සහ අනෙකුත් පොහොර අලෙවිය (සමාගමේ නිෂ්පාදන නොවේ)	395,100	(3,000)	-	5,472,100	640,000	6,504,200
එකතුව	530,430,994	562,734,795	366,093,921	493,551,238	530,974,642	2,483,785,590

සමාගම විසින් පොහොර අලෙවියෙන් 2014/15 වර්ෂයේ සිට 2018 / 19 වර්ෂය දක්වා වර්ෂ 05 ක කාලය තුලදී උපයන ලද ආදායම රු.මිලියන 2,483 ක් වී තිබුණු අතර ඒ තුල වැඩිම අලෙවි ආදායමක් එප්පාවල රොක් පොස්පේට් තුලින් උපයා තිබුණි.එය සමස්ත අලෙවි ආදායමෙන් සියයට 75ක් පමණ වේ.

වගු අංක 04. පොස්පේට් සමාගමෙහි වියදම් විශ්ලේෂණය හා ලාභය - 2014/15 – 2018/19

වියදම	2014/2015	2015/2016	2016/2017	2017/2018	2018/2019
විකුණුම් පිරිවැය	250,027,971	319,223,189	248,209,748	296,818,870	341,893,724
බෙදාහැරීමේ වියදම්/විකිනීමේ හා බෙදාහැරීමේ වියදම	12,366,891	3,396,237	2,699,064	3,560,858	3,940,926
පරිපාලන වියදම් /කර්මාන්ත ශාලා හා පරිපාලන වියදම්	192,170,979	217,005,254	193,907,231	204,872,991	189,960,227
මූල්‍ය වියදම්	-	-	2,153,976	1,482,609	476,976
එකතුව	454,565,841	539,624,680	446,970,019	506,735,055	536,271,853

බදු පෙර ලාභය	**117,858,487**	**60,893,567**	**(32,007,850)**	**38,679,281**	**28,663,251**

මූලාශ්‍රය :- වාර්ෂික වාර්ථා **2014/2015 – 2018/2019** ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම

6.3.7.5 ආයතනය පොස්පේට් මෙ.ටොන් **1**ක් අලෙවිය සඳහා දරන ලද පිරිවැය හා විකුණුම් මිල වගුව අංක **05** සඳහන් වේ.

වගු අංක **05** ඒකක පිරිවැය හා මුලු පිරිවැය - **2014/15 -2018/19**

	2014/2015	**2015/2016**	**2016/2017**	**2017/2018**	**2018/2019**
මෙ.ටොන් **1** කට සෘජු පිරිවැය (රු)	4,326.25	4,692.91	6,207.19	5,867.17	6,292.49
මෙ.ටොන් **1** කට නිෂ්පාදන නොවන පිරිවැය (රු)	3,291.01	4,107.21	5,814.13	4,150.54	4,228.51
මෙ.ටොන් **1** කට මුලු පිරිවැය (රු)	7,617.26	8,800.12	12,021.31	10,017.71	1,0521
නිෂ්පාදනය නොවන පිරිවැය මුලු පිරිවැයෙ % ලෙස	43.2%	46.7%	48.4%	41.4%	40.2%
එප්පාවල රොක් පොස්පේට් (ERP)විකුණුම් මිල මෙ.ටො.**1**කට (රු)	8,778	9,000	9,500	9,500	10,000
අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට්(HERP) විකුණුම් මිල මෙ.ටො.**1**කට (රු)	11,500	11,500	11,500	11,500	12,500

6.3.7.6 ආයතනයේ පසුගිය වර්ෂ පහක කාලය සඳහා සේවක පිරිවැය වගුව අංක **06** හි දැක්වේ. රු.**1,162,027,831** ක් වී තිබුණි.

වගු අංක **06** කාර්යය මණ්ඩල පිරිවැය **2014/15 – 2018/19**

	2014/2015	**2015/2016**	**2016/2017**	**2017/2018**	**2018/2019**
මුලු සේවක පිරිවැය	**192,570,757**	**236,020,214**	**224,677,764**	**230,782,595**	**277,976,501**
මුලු පිරිවැය	**454,565,841**	**539,624,680**	**446,970,019**	**506,735,055**	**536,271,853**
මුලු සේවක පිරිවැය මුලු පිරිවැයේ ප්‍රතිශතයක්	**42.4%**	**43.7%**	**50.3%**	**45.5%**	**51.8%**

ලෙස

සේවක සංඛ්‍යාව	**326**	**286**	**347**	**331**	**335**
එක් සේවකයෙකු වෙනුවෙන් ආයතනය දරන සාමාන්‍ය පිරිවැය	**590,707.84**	**825,245.5**	**647,486.35**	**697,228.38**	**829,780.60**

6.4 එප්පාවල රොක් පොස්පේට් භාවිතයෙන් කේවල සුපර් පොස්පේට් **(Single Super Phosphate)** පොහොර නිපදවීමේ වැදගත්කම

6.4.1 **2014** සිට **2018** දක්වා වූ වර්ෂවල මහ බැංකු වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාව පසුගිය වර්ෂ **05** ක කාල පරිච්ඡේදය තුලදී සාමාන්‍ය යෙන් එක් වර්ෂයක් සඳහා හෙක්ටෙයාර **1,033,000** ක පමණ වී වගා කර තිබුණු අතර, පොහොර ලේකම් කාර්යාලයේ දත්ත අනුව ඒ සඳහා සාමාන්‍යයෙන් ආනයනික ත්‍රිත්ව සුපර් පොස්පේට් පොහොර මෙට්‍රික් ටොන් **35,991** ක් භාවිතා කර තිබුණි.

වගු අංක **07-** වී වගා කරන ලද හෙක්ටෙයාර් ප්‍රමාණය **-2014 – 2018**

	2014	**2015**	**2016**	**2017**	**2018**	එකතුව
වී වගා කරන ලද හෙක්ටෙයාර් ප්‍රමාණය **(000')**	**964**	**1,254**	**1,114**	**792**	**1,041**	5,165

(මහ බැංකු වාර්තාව අනුව)

6.4.2 කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද අංක **26/2018** දරන හා **2018** මාර්තු **23** දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි (ඇමුණුම **08**) **2018** වර්ෂය සඳහා පොස්පේට් අඩංගු ප්‍රධාන ඍජු පොහොර වර්ගය වන ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) ජාතික අවශ්‍යතාව මෙ.ටො.**96,000** ක් බව දක්වා ඇත.

ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** ආනයනය කිරීමට දරන ලද වියදම ශ්‍රී ලංකාවේ මුළු ආනයන වියදමේ ප්‍රතිශතයක් ලෙස ගත්විට **2014** වර්ෂයේදී සියයට **0.025** ක්ද, **2015** වර්ෂයේදී **0.028** ක් ද, **2016** වර්ෂයේදී **0.049** ක්ද, **2017** වර්ෂයේදී **0.04** ක්ද,**2018** වර්ෂයේදී **0.129** ක් ද වශයෙන් ක්‍රමයෙන් ඉහල ගොස් ඇත.

වගු අංක **08** - ආනයනික ත්‍රිත්ව සුපර්පොස්පේට් පිළිබඳ විස්තර

	2014	2015	2016	2017	2018
සම්පූර්ණ ආනයන වියදම - රු.මිලියන	2,535,163.10	2,572,466.50	2,794,393.00	3,198,580.31	3,613,703.06
පොහොර ආනයන වියදම - රු.මිලියන	35,591.00	39,573.10	19,904.20	15,672.89	42,520.46
ත්‍රිත්ව සුපර් පොස්පේට් ආනයන වියදම - රු.මිලියන	637.84	710.84	1,377.07	1,306.58	4,664.90
ආනයනික ත්‍රිත්ව සුපර් පොස්පේට් ප්‍රමාණය- මෙට්‍රික් ටොන්	13,919.65	15,036.45	32,902.66	30,314.00	87,782.45
සම්පූර්ණ ආනයන වියදමෙන් ත්‍රිත්ව සුපර් පොස්පේට් ආනයන වියදම ප්‍රතිශතයක් ලෙස	0.025	0.028	0.049	0.04	0.1291

6.4.3 ආනයනික පොහොර භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක

6.4.3.1 ශ්‍රී ලංකාවට පොහොර ආනයනයේදී සහ රටතුළ පොහොර භාවිතයේදී පොහොරවල තත්වය පාලනය කිරීමටත් ඒවා යොදන භෝගවල සුරක්ෂිතතාවය තහවුරු කිරීමටත් **1988** අංක **68** දරන පොහොර නියාමන පනත මඟින් විධිවිධාන පනවා ඇති අතර එමගින් පොස්පේට් කිලෝග්‍රෑම් **01** ක කැඩ්මියම් මිලිග්‍රෑම් **05** කට ඉහල අගයක් ගනු ලැබූ පොහොර මෙරටට ආනයනය කිරීම තහනම් කර ඇත. **(ඇමුණුම 9)** එසේ වුවද පර්යේෂණ වාර්තා මඟින් පෙන්වා දී ඇති පරිදි ඉතා ඉහළ කැඩ්මියම් හා ආසනික් ප්‍රතිශතයන්ගෙන් යුක්ත පොස්පේට් නිධි පවතින චීනය, බෙලරුස්, ජෝර්දානය, උස්බෙකිස්ථානය, මැලේසියාව යනාදි රටවල් ශ්‍රී ලංකාවට ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** ආනයනය කරන රටවල් අතරින් ප්‍රමුඛ ස්ථානයක් ගෙන ඇති බව පොහොර ලේකම් කාර්යාලයේ දත්ත අනුව හඳුනා ගන්නා ලදි. **(ඇමුණුම 10)**

6.4.3.2 තවද කැඩ්මියම් මිනිස් ශරීරයට අහිතකර විෂ රසායන ද්‍රව්‍යයක් වන අතර වකුගඩුවල දීර්ඝ කාලීනව කැඩ්මියම් තැන්පත්වීම වකුගඩු අක්‍රීය වීමට ප්‍රධාන වශයෙන් බලපාන බවත් ඊට අමතරව අක්මාවේ හා මොලයේ පිළිකා, රක්තහීනතාවය, අධිරුධිර පීඩනය යනාදී රෝගාබාධ ගණනාවකට කැඩ්මියම් ශරීර ගතවීම මූලයක් වන බවත් මහාචාර්ය සී.බී.දිසානායක හා මහාචාර්ය රෝහණ චන්ද්‍රජීත් යන අය විසින් **2009** වර්ෂයේදී සිදුකල පර්යේෂණයකට අනුව **(ඇමුණුම 11)** අනාවරණය වී ඇත. එම පර්යේෂණයට අදාළ වාර්තාව සබරගමුව විශ්ව විද්‍යාලය ප්‍රකාශයට

පත්කර ඇති **Number 2; 2014 December** ජ'නලයෙහි **Volume 13** හි **Chronic Kidney Disease(CKD) in Sri Lanka –Current Research Evidence Justification** ලෙස දක්වා ඇත.

වගු අංක **09** - පොහොර වල අඩංගු ලෝහ ප්‍රමාණය

Collected Location	Fertilizer type	Al	Cr	Ni	Cd	Pb	U
Anuradhapura	Urea	37	3.9	1.4	0.4	3.8	6.0
	NPK	203	3.9	1.4	0.4	3.8	20.1
	TSP	9.949	52.9	35.2	3.6	50.7	107
Medawachchiya	Urea	32	3.9	1.4	0.4	3.8	6.0
	NPK	262	3.9	1.4	0.4	3.7	6.5
	TSP	9.405	43.6	27.1	4.0	79.2	75.9
Medirigiriya	Urea	25	210.3	1.4	0.4	3.7	28.3
	NPK	135	23.7	1.4	0.4	3.8	6.1
	TSP	8.563	59.5	22.3	46.1	41.1	5.8
Girandurukotte	Urea	54	19.6	1.4	0.4	6.0	25.3
	NPK	143	22.8	1.4	0.4	3.8	6.1
	TSP	9.016	65.9	24.2	39.8	58.2	64.1
Girandurukotte	Urea	27	Nd	1.6	Nd	4.0	Nd
	NPK	77	2.6	1.3	0.5	2.6	119
	TSP	5.177	19.2	10.6	2.3	67.2	364
Kandy	Urea	52	21.0	1.4	0.4	3.9	24.4
	NPK	140	22.1	1.4	0.6	3.8	6.1
	TSP	10.113	62.1	27.3	4.3	80.2	166

6.4.3.3. වෛද්‍ය ප්‍රසන්න කුරේ මහතා විසින් ජාතික පුවත්පතකට ඉදිරිපත් කර ඇති අන්තර්ජාලයෙන් උපුටා ගත් තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ මුලු භූමි ප්‍රමාණයෙන් **1/6** ක වපසරියක් මහවැලි පෝෂක ප්‍රදේශයන් වන අතර මෙය මධ්‍යම කඳුකරයේ සිට පහලට විහිදෙන්නෙකි.තේ ,අර්තාපල් හා වෙනත් එළවළු බෝග වගාවන්ට රසායනික ද්‍රව්‍ය අධික ලෙස යෙදීම නිසා හා වන විනාශයට

සමගාමීව සිදු වන පස සෝදා පාලුව සමඟ රසායනික වස විස අවසානයේදී මහවැලි ජලය හා මුසු වේ.එමෙන්ම කැඩ්මියම් බහුල රසායනික යෙදවුම් අතරින් ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) සුවිශේෂ වේ.(ඇමුණුම 12)

6.4.4 ශ්‍රී ලංකාවේ කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිෂ්පාදනය ආරම්භ කලහොත් කර්මාන්තය පුළුල්වීමත් සමඟ නව සෘජු රැකියා උත්පාදනය වීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහල යන අතර ආසන්න ප්‍රදේශවල වක්‍ර රැකියා ප්‍රමාණයක්ද ඇති වන බව පොස්පේට් රාජ්‍ය සමාගම විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කල කේවල සුපර් පොස්පේට් නිපදවීමේ ව්‍යාපෘති වාර්තාව මගින් අනාවරණය කර තිබුණි. (ඇමුණුම 13)

6.4.5 එසේම එප්පාවල රොක් පොස්පේට්වල කැඩ්මියම් හා ආසනික් අඩු ප්‍රමාණයක් පවතින බැවින් එමගින් නිපදවනු ලබන කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** භාවිතා කිරීමෙන් වර්තමානයේ ව්‍යසනයක්ව පවතින වකුගඩු රෝගය මෙන්ම පිළිකා, හෘදයාබාධ, දියවැඩියාව වැනි රෝගවලින් සමාජයට ඇති වී තිබෙන අහිතකර බලපෑම අවම වන බව මහාචාර්ය චන්න ජයසුමන ඇතුළු හත් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් විසින් පර්යේෂණ පවත්වා නිකුත් කර ඇති **Phosphate Fertilizer is a main source of arsenic in areas affected with chronic kidney disease of unknown etiology in Sri Lanka** යන පර්යේෂණ වාර්තාව මඟින් හා **2017** ජූලි **11** වන දින කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය විසින් මාසිකව නිකුත් කරන ලද විදුසර විද්‍යා සඟරාව මගින් පැහැදිලි කර ඇත. ඒ අනුව වර්තමානයේදී සමාජය මුහුණ දී සිටින ඉහත සඳහන් බෝනොවන රෝගවලට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති කැඩ්මියම් හා ආසනික් අවම වශයෙන් ඇති පොහොර භාවිතය නිසා එකී රෝගාබාධ අවමවීම සිදුවන බව හඳුනාගෙන ඇත (ඇමුණුම **14)**

6.5 කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිෂ්පාදනය සඳහා වන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කල **2006** අගෝස්තු **29** දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය **(ඇමුණුම 15)** සඳහා අමප**/06/1596/266/025** හා **2006** සැප්තැම්බර් **13** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය **(ඇමුණුම 16)** ලබා දී තිබුණි. එම තීරණය අනුව යෝජනාවල මූල්‍යමය සවිමත්භාවය තහවුරුකිරීම සඳහා ඒවා ක්‍රියාත්මක කිරීම පිණිස හා ඒවා ක්‍රියාත්මක කිරීමට පෙරාතුව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විමසමින් සවිස්තර සමාලෝචනයක් කිරීමට තීරණය කර තිබුණි. ඉන් අනතුරුව කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයාගේ **2006** නොවැම්බර් **08** දිනැති සටහන හා මුදල් ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය සලකා බලන ලදුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය **(ඇමුණුම 17)** ලබාදෙන ලදී. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පොහොර ආනයනය සඳහා වැයවන වාර්ෂික සාමාන්‍ය වියදම රුපියල් මිලියන **900** ක් ඉතිරි කරගත හැකි බවත්, කර්මාන්තය ආරම්භ කිරීම සඳහා මුළු අරමුදල් අවශ්‍යතාවය රුපියල් මිලියන **681** ක් වන බවත්

එයින් සියයට 50 ක් දේශීය බැංකු විසින් සම්පාදනය කරන බවත් ඉතිරි සියයට 50 සඳහා ලංකා පොස්පේට් සමාගම දායකත්වය දරන බවත් දක්වා තිබුණි.

6.6 කේවල සුපර් පොස්පේට් (Single Supper Phosphate) පොහොර නිෂ්පාදනයට අවශ්‍ය සල්ෆියුරික් නිෂ්පාදනාගාරයක් සහිතව නිෂ්පාදනය කිරීම

6.6.1 නිෂ්පාදනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘති යෝජනාව

සල්ෆියුරික් නිෂ්පාදනාගාරයක් සහිතව කේවල සුපර් පොස්පේට් (Single Supper Phosphate) මෙට්‍රික් ටොන් 60,000 ක් වාර්ෂිකව නිෂ්පාදනය කලහැකි ධාරිතාවයකින් යුක්ත පොහොර නිෂ්පාදනාගාරයක් සඳහා මූලික ආයෝජනය රුපියල් මිලියන 733 ක් බවත්, එහි පිළිගෙවුම් කාලය අවුරුදු 06 යි මාස 06 ක් බවත් 2006 වර්ෂයේදී සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම විසින් පිළියෙල කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණු(preliminary project proposal for manufacturing of SSP fertilizer using local phosphate rock) ව්‍යාපෘති වාර්තාවේ දක්වා තිබුණි. මෙට්‍රික් ටොන් 100,000 ක ධාරිතාවයකින් යුක්ත නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීම සඳහා 2006 වර්ෂයේදී මිල ගණන් අනුව ආයෝජනය කලයුතුව තිබුණු මුදල රුපියල් මිලියන 1,222 ක් වූ අතර 2006 වර්ෂයේදී ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. ඒ අනුව 2017 වර්ෂය වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීම හේතුවෙන් 2017 වර්ෂයේදී නැවතත් ව්‍යාපෘති වාර්තාවක්(project proposal for manufacturing of SSP) ඉදිරිපත් කර තිබුණි. කේවල සුපර් පොස්පේට් (Single Supper Phosphate) මෙට්‍රික් ටොන් 100,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් මිලියන 9,000 ක් ආයෝජනය කලයුතු බව එකී ව්‍යාපෘති වාර්තාවේ දැක්වීණි (ඇමුණුම 18).

6.6.2 සල්ෆියුරික් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම

එප්පාවල රොක් පොස්පේට් භාවිතයෙන් කේවල සුපර් පොස්පේට් (Single Super Phosphate) නිෂ්පාදනය කිරීම සඳහා සල්ෆියුරික් අම්ලය අවශ්‍ය වන අතර එය ආනයනය කිරීම මගින් හෝ මෙරට නිෂ්පාදනය කිරීමෙන් සපයා ගතහැක. ආනයනය කිරීමේදී විදේශ විනිමය ගැටළු මතුවන අතර මෙරට නිෂ්පාදනය කිරීම ලාභදායිද වේ. එසේම සල්ෆියුරික් අම්ලය මෙරට නිෂ්පාදනය කිරීමෙන් පහත කර්මාන්තවල/නිෂ්පාදන වල අවශ්‍යතාවය සඳහා සල්ෆියුරික් අම්ලය ආනයනය කිරීමට වාර්ෂිකව වැයකරන රුපියල් මිලියන සියයකට අධික මුදලක්ද (ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු දත්ත අනුව) ඉතිරිකර ගත හැකිවේ. (ඇමුණුම 19)

- Batteries
- Detergent
- Fertilizers
- Iron and steel pickling

- **Lubricating oils**
- **Oil additives**
- **Agriculture chemicals**

6.7 පොස්පේට් අමු ද්‍රව්‍යයක් ලෙස යොදා ගැනීම

අමුද්‍රව්‍ය ලෙස එප්පාවල රොක් පොස්පේට් **(ERP)** හෝ අධිශ්‍රේණි එප්පාවල රොක් පොස්පේට් **(HERP)** අපනයනය කිරීම "බුලංකුලම සහ තවත් අය එදිරිව කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හා තවත් අය" යන නඩු තීන්දුව අනුව විත්තිකරුවන්ට සහ වඟ උත්තරකරුවන්ට පොස්පේට් නිධිය සම්බන්ධ කිසිදු ගිවිසුමකට එළඹීමට නොහැකි වී ඇතිඅතර එප්පාවල රොක් පොස්පේට් **(ERP)** හෝ අධි ශ්‍රේණි එප්පාවල රොක් පොස්පේට් **(HERP)** අමුද්‍රව්‍යක් ලෙස අපනයනය කිරීම ද වැලකී ඇත. **(ඇමුණුම 20)**

6.8. **2019** ජූලි **12** දින පැවැත්වූ කෘෂිකර්ම අමාත්‍යාංශයේ පොහොර උපදේශන කමිටුව (Fertilizer Advisory Committee) මඟින් ගෙන ඇති තීරණයන්ට අනුව ගොවීන්ට ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) වෙනුවට කේවල සුපර් පොස්පේට් (SSP) භාවිතා කිරීමට ධෛර්යමත් කිරීමට හා එප්පාවල රොක් පොස්පේට් භාවිතයෙන් කේවල සුපර් පොස්පේට් නිපදවීම සඳහා ධෛර්යමත් කිරීම සඳහා තීරණයක් ගෙන තිබුණි.**(ඇමුණුම 21)**

07. නිරීක්ෂණ

7.1 කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිෂ්පාදනයට අවශ්‍ය කටයුතු සම්පාදනය නොකිරීම හේතුවෙන් ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වූ අතර එප්පාවල රොක් පොස්පේට් භාවිතා කර කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** මෙරට නිෂ්පාදනය කිරීමට හැකියාව තිබියදීත් **2018** වර්ෂයේදී කේවල සුපර් පොස්පේට් **(Single**

Supper Phosphate) මෙට්‍රික් ටොන් 3508.5 ක ප්‍රමාණයක් ආනයනය කිරීමට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1,276,500 ක වියදමක් දරා තිබුණු බව නිරීක්ෂණය විය.

7.2 පොහොර නිෂ්පාදනය කර අපනයනය කිරීම සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමේ මූලික අරමුණක් වුවද එකී සමාගම ආරම්භ කර වර්ෂ 25 කට අධික කාලයක් ගතවී ඇතත් 6.2.7.2 ඡේදයෙහි පරිදි පොස්පේට් අමුද්‍රව්‍යක් ලෙස සමාගම් කිහිපයකට අලෙවි කිරීමත්, පොල් පොහොර නිෂ්පාදනය කිරීමත් හැර කෙටි කාලීන බෝග වගාව සඳහා අවශ්‍ය පොස්පේට් පොහොර නිෂ්පාදනය හෝ අනෙකුත් නිෂ්පාදන විවිධාංගිකරණයට සමාගම යොමු වී නොතිබුණි.

7.3 පසුගිය වර්ෂ පහ තුල සමාගමෙහි මුළු පිරිවැයෙහි සියයට 46.2 ක පමණ සාමාන්‍ය සේවක පිරිවැයක් අන්තර්ගත වන අතර එක් සේවකයකු නඩත්තු කිරීම වෙනුවෙන් සාමාන්‍යයෙන් රු.718,089 ක පමණ වාර්ෂික පිරිවැයක් සමාගම දරන අතර එම පිරිවැයට සාපේක්ෂව සමාගමෙන් ආර්ථිකයට වන දායකත්වය ප්‍රමාණවත් නොවන බව උක්ත 7.2 ඡේදයෙහි දැක්වෙන කරුණු අනුවද නිරීක්ෂණය විය .තවද උතුරු සහ දකුණු නිධි වල පවතින මෙ.ටොන් 60 ක පමණ ධාරිතාවයෙන් සියයට 0.02 ක ධාරිතාවයක් පමණක්, මෙම පොස්පේට් නිධියෙහි අයිතිය හිමි වූ අනෙකුත් ආයතනත්, 1992 න් පසු සමාගමත් උපයෝජනය කර තිබුණි.

7.4 එප්පාවල රොක් පොස්පේට් (ERP) හා අධි ශ්‍රේණි එප්පාවල රොක් පොස්පේට් (HERP) මෙට්‍රික් ටොන් එකක මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයයට 40කට වඩා වැඩි ප්‍රමාණයක නිෂ්පාදන නොවන පිරිවැය අන්තර්ගත වී තිබුණු අතර සමාගමේ ලාභයද 2014/15 වර්ෂයට සාපේක්ෂව 2018/19 වර්ෂයේදී සියයට 76 ක පමණ පහළ යාමක් නිරීක්ෂණය විය.

7.5 තවද 2016/17 වර්ෂයේ සිට 2018/19 වර්ෂය දක්වා වර්ෂ තුන තුල එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙ.ටො. 1 ක විකුණුම් මිල මුළු නිෂ්පාදන පිරිවැයට වඩා අඩු අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය.

7.6 6.4 ඡේදයේ දැක්වෙන පරිදි ලංකාවට ආනයනික පොහොර සඳහා දරනු ලබන වියදම ඉතිරි කර ගැනීමේ අරමුණින් කේවල සුපර් පොස්පේට් නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට 2006 නොවැම්බර් 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට 2019 ඔක්තෝබර් 31 දින වන විටද සමාගම කටයුතු කරනොතිබුණි..

7.7 සල්ෆියුරික් නිෂ්පාදනාගාරයක් සහිත කේවල සුපර් පොස්පේට් නිෂ්පාදනය සඳහා ව්‍යාපෘති යෝජනාව 2006 වර්ෂයේ ක්‍රියාත්මක නොකර අත්හැර දැමීම හේතුවෙන් 2017 වර්ෂය වන විට එම ධාරිතාවයෙන් යුතු නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 7,778 ක් වැඩිපුර ඇස්තමේන්තු කිරීමට සිදුවී තිබුණි. තවද 2006 වර්ෂයේදී එම ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් අවුරුදු 11 ක කාල පරිච්ඡේදය තුල ඉහළ ආනයනික වියදමක් දරමින් ත්‍රිත්ව සුපර් පොස්පේට් (Triple Supper Phosphate) ආනයනය කිරීමට ද සිදුවී තිබුණි.

7.8 කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය සල්ෆියුරික් නිෂ්පාදනාගාරයක් මෙරට ස්ථාපිත කිරීමෙන් **Batteries, Detergent, Fertilizers, Iron and steel pickling, Lubricating oils, Agriculture chemicals** යන කර්මාන්තවල අවශ්‍යතාවයට සල්ෆියුරික් ආනයනය සඳහා වැයවන විදේශ විනිමය සම්පූර්ණයෙන්ම ඉතිරිකර ගැනීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය වූ අතර **2017** වර්ෂයේදී ඉහත කර්මාන්තවල අවශ්‍යතාවය සඳහා සල්ෆියුරික් ආනයනය සඳහා වැය කර තිබූ වියදම රු.**100,701,249** ක් වී තිබුණි.

7.9 එප්පාවල පොස්පේට් වල පවතින කැඩ්මියම් සංයුතිය සියයට **0.0005** ක් වූ අතර ආනයනය කරන ලද ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** වල අඩංගු කැඩ්මියම් ප්‍රමාණය නිර්ණය කිරීමක් කර නොතිබුණු බවත් නියමිත කැඩ්මියම් ප්‍රමාණය ඉක්ම වූ ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** දිවයිනේ ස්ථාන කිහිපයකින්ම සොයා ගැනීමට හැකිවී ඇති බව ,ඉහත **6.3.2.1** ඡේදයේ සඳහන් පර්යේෂණ වාර්තාවෙන් දක්වා තිබුණි. නමුත් ප්‍රමාණවත් සම්පත් තිබියදීත් එප්පාවල පොස්පේට් භාවිතා කර කේවල සුපර් පොස්පේට් නිපදවීමට අවශ්‍ය පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

7.10 තවද මෙම ආනයනික පොහොර භාවිතා කිරීම රෝග කිහිපයක් සඳහා හේතුවන බව හඳුනාගෙන තිබුණද එලෙස පොහොර ආනයනය සීමා කිරීමට එක් පියවරක් ලෙස අඩු කැඩ්මියම් සහිත පොස්පේට් භාවිතා කර පොහොර නිපදවීමට කටයුතු කර නොතිබුණි.

7.11 උක්ත **6.7** ඡේදයේ පරිදි ගොවීන්ට ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) වෙනුවට කේවල සුපර් පොස්පේට් (SSP) භාවිතා කිරීමට ධෛර්යමත් කිරීමට හා එප්පාවල රොක් පොස්පේට් භාවිතයෙන් කේවල සුපර් පොස්පේට් නිපදවීම සඳහා ධෛර්යමත් කිරීම යන තීරණයක් ගෙන තිබුණද **2019** නොවැම්බර් **25** දින වන විටද එම තීරණයට අනුව කටයුතු කර නොතිබුණි.

7.12 **2014** වර්ෂයේදී සමාගම විසින් වාරියපොල ප්‍රදේශයේ පිහිටුවා ඇති පොල් පොහොර නිෂ්පාදනාගාරය **2015** වර්ෂයේ සිට අලාභ ලබන ආයතනයක් බවට පත් වී තිබුණි.

08. නිර්දේශ

8.1 පසුගිය වර්ෂ පහ තුලදී පමණක් වර්ෂයකට සියයට **46** ක පමණ සාමාන්‍ය සේවක පිරිවැයක් දරමින් **1992** වර්ෂයේ සංස්ථාපනය කර පවත්වාගෙන යනු ලබන සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගම පිහිටුවීමේ අරමුණු ආර්ථිකයට ඵලදායි ලෙස ළඟාකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් කඩිනමින් පියවර ගතයුතු වීම.

(යොමුව : 7.3)

8.2 විධිමත් ශක්‍යතා අධ්‍යනයකින් පසු සල්ෆියුරික් යන්ත්‍රාගාරයක් හා කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කර ජනතාවට පීඩාකාරී නොවන අයුරින් හා පරිසරයට හානි නොවන අයුරින් මහා පරිමාණයෙන් කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිපදවා දේශීය අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමටත්, අතිරේක නිෂ්පාදනය අපනයනය කිරීමටත් අවශ්‍ය පියවර ගැනීම.

(යොමුව : 7.6, 7.7, 7.8)

8.3 වර්තමානයෙහි දැඩි අර්බුදයක්ව පවතින වකුගඩු රෝග, පිළිකා වැනි බෝ නොවන රෝග පැතිරීමට දායක වෙතැයි සැලකෙන ආනයනික ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** පොහොර භාවිතය සීමා කිරීම සුදුසු බවත්, අඩු කැඩ්මියම් හා ආසනික් ප්‍රතිශතයක් සහිත එප්පාවල පොස්පේට් නිධිය භාවිතයට ගැනීමෙන් මෙම තත්ත්වය අවම කරගැනීමට අවශ්‍ය පියවර ගැනීම

(යොමුව : 7.10)

8.4 කේවල සුපර් පොස්පේට් **(Single Supper Phosphate)** නිෂ්පාදනයට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම තුලින් ත්‍රිත්ව සුපර් පොස්පේට් **(Triple Supper Phosphate)** ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය ප්‍රමාණය අවම කර ගැනීමට පියවර ගැනීම

(යොමුව : 7.1)

8.5 සී/ස ලංකා පොස්පේට් රාජ්‍ය සමාගමට භූමි සම්පත් භාවිතා කර නිෂ්පාදන විවිධාංගීකරණයට යොමුවීම තුලින් පොස්පේට් නිධිය ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීම

(යොමුව : 7.2)

8.6 සමාගම විසින් වාරියපොල ප්‍රෙද්ශයේ පිහිටුවා ඇති පොල් පොහොර නිෂ්පාදනාගාරය ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමට අවශ්‍ය පියවර ගැනීමත්, සමාගමේ ලාභයද ඉහළ නංවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම

(යොමුව : 7.12)

8.7 පෞද්ගලික සමාගම් සඳහා පොස්පේට් අලෙවි කිරීමේ දී පිරිවැය පාලනය මගින් හෝ වෙනයම් ක්‍රමයකට පිරිවැය ඉක්මවූ විකුණුම් මිලක් නියමකිරීමට කටයුතු කිරීම

(යොමුව : 7.5)

8.8 අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු කේවල සුපර් පොස්පේට් නිෂ්පාදන ව්‍යාපෘතිය හා සල්ෆියුරික් නිෂ්පාදනාගාරයක් සහිත කේවල සුපර් පොස්පේට් නිෂ්පාදනය සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු වූ කරුණු පරීක්ෂා කිරීම සඳහා විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම

(යොමුව : 7.6)

8.9 ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) වෙනුවට කේවල සුපර් පොස්පේට් (SSP) භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම

(යොමුව : 7.11)

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති
2020 ජනවාරි 20 දින

இலங்கையின் அபிவிருத்திக்காக எப்பாவல பொஸ்பேட் குவியல்களின் உச்ச கொள்ளளவைப் பயன்படுத்துதலை மதிப்பீடு செய்வதற்கான விசேட கணக்காய்வு அறிக்கை

---

01. நிறைவேற்றுப் பொழிப்பு

இலங்கையில் 02 பாறைப் பொஸ்பேட் குவியல்கள் அமைந்துள்ளதுடன் பொருளாதார ரீதியாக மிகவும் முக்கியத்துவமாக உள்ள பொஸ்பேட் குவியலான எப்பாவல பொஸ்பேட் குவியல் அனுராதபுரம் மாவட்டத்திலுள்ள தலாவ பிரதேச செயலாளர் பிரிவிலுள்ள தலாவ பிரதேசத்தில் அமைந்துள்ளது. 06 சதுர கிலோ மீற்றர் அளவான பிரதேசத்தில் பரவியுள்ள இக்குவியல் 60 மில்லியன் மெற்றிக் தொன்கள் கொள்ளளவைக் கொண்டது என இனங்காணப்பட்டுள்ளதுடன் இது 1971 ஆம் ஆண்டின் போது புவிச்சரிதவியல் திணைக்களத்தினால் கண்டுபிடிக்கப்பட்டிருந்ததுடன் 1971 - 1974 காலத்தில் அதற்கு அருகாமையில் அளவீட்டு நடவடிக்கைகள் படம் வரைதல், நிலத்தில் துளையிடுதல் மேற்கொள்ளல், குவியலை ஒன்று சேர்த்தல் முதலியன இடம்பெற்றுள்ளன. 1974 ஆம் ஆண்டின் போது மாவட்ட அபிவிருத்திச் சபையினால் சிறிய அளவிலான அகழ்தல்கள் தொடக்கி வைக்கப்பட்டிருந்ததுடன் 1978 ஆம் ஆண்டின் போது அந்நடவடிக்கையானது அரசாங்க சுரங்கங்கள் மற்றும் கனியப்பொருள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்திற்கு ஒப்படைக்கப்பட்டிருந்தது. 1992 ஆம் ஆண்டின் போது வரையறுக்கப்பட்ட இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனி தோற்றுவிக்கப்பட்டதன் பின்னர் அதன் அகழ்வு நடவடிக்கையானது அக்கம்பனியால் மேற்கொள்ளப்பட்டு வருகின்றது. எவ்வாறாயினும், இக்குவியல் கண்டுபிடிக்கப்பட்டு 46 ஆண்டுகள் கடந்திருந்தும் அதனை நாட்டின் அபிவிருத்திக்கு சிறப்பாக ஈடுபடுத்துவதற்கு முடியாதிருந்தது என்பது அவதானிக்கப்பட்டது.

இறக்குமதி செய்யப்பட்ட மும்மடங்கு சுப்பர் பொஸ்பேட்களுக்கு (Triple Super Phosphate) பிரதியீடாகப் பயன்படுத்தக்கூடிய தனித்த சுப்பர் பொஸ்பேட்களை (Single Super phosphate) தயாரிப்பதற்காக இக்குவியலை பயன்பாட்டிற்கு எடுத்துக் கொள்ளலாம் என பல்வேறு அறிஞர்களின் ஆராய்ச்சிகளிலிருந்து வெளிப்படுத்தப்பட்டிருந்ததுடன் வரையறுக்கப்பட்ட பொஸ்பேட் அரசாங்க கம்பனி, விவசாய அமைச்சு மற்றும் அமைச்சரவையினால் பல்வேறு சந்தர்ப்பங்களின் போது தனித்த சுப்பர் பொஸ்பேட் தயாரிப்பதற்குத் தீர்மானம் எடுக்கப்பட்டிருந்தும் அத்தீர்மானம் இன்று வரை அமுல்படுத்தப்பட்டிருக்கவில்லை.

மும்மடங்கு சுபர் பொஸ்பேட்களுக்கு (Triple Super Phosphate) பிரதியீடாக எப்பாவல தனித்த சுப்பர் பொஸ்பேட் (Eppawala Single Super phosphate) களின் உற்பத்தி ஆரம்பிக்கப்பட்டிருந்தும் மும்மடங்கு சுப்பர் பொஸ்பேட் (Triple Super Phosphate) இனை இறக்குமதி செய்வதற்காக செலவு செய்யப்படுகின்ற வெளிநாட்டு நாணயம் சேமிக்கப்படுவதுடன் மிகையான உற்பத்திகளை ஏற்றுமதி செய்வதன் மூலம் வெளிநாட்டு நாணயமாற்றை உழைக்கக்கூடியதாக இருக்கும். அவ்வாறே எப்பாவல பொஸ்பேட்களில் கெட்மியம் மற்றும் ஆசனிக் மிகவும் சிறிய அளவில் உள்ளதன் காரணமாக தற்பொழுது தீவிரமாகக் காணப்படுகின்ற சிறுநீரக வியாதியைப் போல புற்றுநோய் மற்றும் இருதய நோயை குறைக்க கூடியதாக இருக்கும் என்பதுவும் வெளிப்படுத்தப்பட்டிருந்தது. மேலும், தனித்த சுபர் பொஸ்பேட் (Single Super Phosphate) உற்பத்தி மற்றும் உற்பத்தியை பல்லினப்படுத்துதலில் ஈடுபடுவதன் மூலம் வரையறுக்கப்பட்ட லங்கா பொஸ்பேட் அரசாங்க கம்பனியை தோற்றுவித்ததன் குறிக்கோளை நிறைவேற்றுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டமென்பது அவதானிக்கப்பட்டது.

02. அறிக்கையின் பின்னணியும் தன்மையும்

பொருளாதார முக்கியத்துவம் கொண்ட இயற்கை வளமான எப்பாவல பொஸ்பேட் குவியலை இலங்கையின் அபிவிருத்தி செயற்பாடுகளுக்கு ஈடுபடுத்துவது தொடர்பாக அரசாங்கம் வரையறுத்த லங்கா பொஸ்பேட் அரசாங்க கம்பனி, அரசியல் கட்சிகள், பல்வேறு அறிஞர்கள், சுற்றாடலாளர்கள், பிரதேசத்திலுள்ளவர்கள், மற்றும் ஊடகவியலாளர்களின் கவனத்திற்கு உட்பட்டிருந்தது. மேலும், விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சின் கீழுள்ள தேசிய விஞ்ஞான மன்றத்தினால் எப்பாவல பொஸ்பேட் குவியலின் அமைவிடம், அதிலிருந்து உற்பத்தி செய்யக்கூடிய பசளை மற்றும் அப்பசளையை பயன்பாட்டிற்கு எடுத்து உள்நாட்டு விவசாயத்திற்கு தேவையான பசளையை உற்பத்தி செய்தல் மற்றும் அப்பசளைகளின் வினைத்திறன் தொடர்பாக அடிக்கடி பல்வேறு பரிசோதனைகள் மேற்கெண்டு அறிக்கை தயாரிக்கப்பட்டிருந்தது. எவ்வாறாயினும், 1971 ஆம் ஆண்டின் போது இனங்காணப்பட்ட இந்த பொஸ்பேட் குவியலை 2018 ஆம் ஆண்டு இறுதிவரையும் நாட்டின் அபிவிருத்திக்கு ஈடுபடுத்துவதற்கு தேவையான முயற்சிகள் எடுப்பதற்கு மேற்கூறப்பட்ட தரப்பினர்களுக்கு முடியாதிருந்தது. எனவே சுற்றாடல் மற்றும் சமூக சிக்கல்களைக் குறைக்கும் வகையில் பொஸ்பேட்குவியலை பொருளாதார ரீதியாக வினைத்திறனாகப் பயன்படுத்துவதற்கு தரப்பினர்கள் கவனம் செலுத்துதல் இந்த விசேட அறிக்கையின் எதிர்பார்ப்பாகும்.

03. அறிக்கையினைத் தயாரிக்கும் போது பின்பற்றப்பட்ட நடைமுறைகள்

இந்த அறிக்கையைத் தயாரிக்கும் போது பின்வரும் நடைமுறைகள் பின்பற்றப்பட்டிருந்தன.

3.1 ஆவணங்களைப் பரீட்சித்து தகவல்களைச் சேகரித்தல்

3.1.1 வரையறுக்கப்பட்ட லங்கா பொஸ்பேட் அரசாங்க கம்பனியின் (LPL) அமைப்பு புறவிதி

3.1.2 வரையறுக்கப்பட்ட லங்கா பொஸ்பேட் அரசாங்க கம்பனியின் (LPL) உருவாக்கல் சான்றிதழ்

3.1.3 1988 இன் 68 ஆம் இலக்க பசளைகளை முறைமைப்படுத்துதல் அதிகாரச்சட்டம்.

3.1.4 Preliminary project proposal for the manufacture of SSP Fertilizer using local Phosphate Rock - Lanka Phosphate Ltd.

3.1.5 Sri Lanka Standard Specificatin for rock Phoshpate

3.1.6 விவசாய அமைச்சினால் வழங்கப்பட்ட ‘‘விவசாய தொழில்நுட்பம்’’ சஞ்சிகை

3.1.7 Project Proposal for manufacture of SSP - Lanka Phosphate Ltd.

3.1.8 Market Survey for Eppawala SSP Fertilizer Lanka Phosphate Ltd.

3.1.9 Manufacture of coconut Fertilizer - Lanka Phosphate Ltd.

3.1.10 Research Findings on ESSP Fertilizer - Lanka Phosphate Ltd. & Agriculture Department

3.1.11 2008 ஆம் ஆண்டின் போது லங்கா பொஸ்பேட் அரசாங்க கம்பனியினால் (LPL) மத்திய சுற்றாடல் அதிகாரசபைக்கு (CEA) சமர்ப்பிக்கப்பட்டுள்ள சுற்றாடல் நிலைமைத் தாக்கம் தொடர்பான மதிப்பீட்டு அறிக்கை

3.1.12 தேசிய விஞ்ஞான மன்றத்தின் (NSF) மூலம் பிரசித்தப்படுத்தப்பட்டுள்ள ஆராய்ச்சி அறிக்கை

3.1.13 மத்திய வங்கி அறிக்கை

3.1.14 இது சம்பந்தமாக வழங்கப்பட்டுள்ள கணக்காய்வு ஐய வினாக்கள்

3.2 ஏனைய பரீட்சித்தல்கள்

3.2.1 இணையத்தளத்தை பரீட்சித்து தகவல்களைப் பெற்றுக் கொள்ளல்

3.2.2 சபரகமுவ பல்கலைக்கழகத்தின் முன்னாள் உபவேந்தர் சந்தன பீ.உடவத்த அவர்களிடமிருந்து மற்றும் ரஜரட பல்கலைக்கழகத்தின் மருத்துவ பீடத்தின் பேராசிரியர் சன்ன ஜயசுமன அவர்களிடமிருந்து விசேடத்துவமான உதவியைப் பெற்றுக்கொள்ளல்.

3.2.3 வரையறுக்கப்பட்ட லங்கா பொஸ்பேட் கம்பனியின் (LPL) தலைவர் மற்றும் பொது முகாமையாளரை உள்ளடக்கிய மேல்மட்ட முகாமைத்துவத்துடன் கலந்துரையாடல்.

3.2.4 பொஸ்பேட் குவியல் மற்றும் பொஸ்பேட் கம்பனியின் உற்பத்தி நிலையங்களை அவதானித்தல்.

04. கணக்காய்வின் நோக்கெல்லை

இறக்குமதி செய்த மும்மடங்கு சுப்பர் பொஸ்பேட்களுக்கு (Triple Super Phosphate) பிரதியீடாக தனித்த (Super Phosphate) தயாரிக்கும் தேவைப்பாடுகள் நீண்டகாலம் பயிர்களுக்கான பசளைத் தேவைகளுக்காக தயாரிப்பதற்காக எப்பாவல பொஸ்பேட் குவியலை சிறப்பான முறையில் பயன்படுத்துதல், அப்பசளைகளை இலங்கையின் விவசாய நடவடிக்கைகளுக்காகப் பயன்படுத்தும் இயலுமை, அதன் தேவைப்பாடு மற்றும் முக்கியத்துவத்தைப் பரீட்சித்தல் இடம்பெற்றிருந்தது.

05. கணக்காய்வு நோக்கெல்லையின் மட்டுப்பாடுகள்

5.1 வரையறுக்கப்பட்ட இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனியின் (LPL) எப்பாவல பிரதான அலுவலகத்திற்கு தீயினால் பாதிப்பு ஏற்பட்டதன் காரணமாக சில முக்கியமான ஆவணங்கள் அழிவடைந்ததனால் அந்த ஆவணங்களை கணக்காய்விற்குப் பயன்படுத்திக் கொள்ள முடியாதிருந்தமை.

5.2 கணக்காய்வின் நேரடி அவதானிப்புக்களுக்கு மேலதிகமாக ஏனைய வெளிவாரியான தொழில்சார் ஆராய்ச்சி அறிக்கைகளையும் தொடர்புபடுத்திக் கொண்டதன் காரணமாக அவ்வாறான வெளிவாரி அறிக்கைகளின் அவதானிப்புக்களை அடிப்படையாகக் கொண்டு நடவடிக்கை எடுக்க வேண்டியிருந்தமை.

06. நடைமுறை

6.1 எப்பாவல பொஸ்பேட் குவியல் தொடர்பான அறிமுகம்

6.1.1 எப்பாவல பொஸ்பேட் குவியலின் அமைவிடமும் கண்டுபிடித்தலும்

6.1.1.1 புவிச்சரிதவியல் திணைக்களத்தினால் 1971 ஆம் ஆண்டின் போது பாறை பொஸ்பேட்களின் 02 குவியல்கள் எப்பாவல மற்றும் கவிசிகமுவ பிரதேசங்களில் கண்டுபிடிக்கப்பட்டிருந்தன. அவற்றில் பொருளாதார பெறுமதி கொண்ட மிகப்பெரிய குவியல் அனுராதபுர மாவட்டத்திலுள்ள தலாவ பிரதேச செயலகப் பிரிவிலுள்ள எப்பாவல பிரதேசத்தில் அமைந்துள்ளது. இந்த பொஸ்பேட் குவியல் 06 சதுர கிலோ மீற்றர் அளவிலான நிலப்பகுதியில் பரவியுள்ளது எனவும் மிகவும் கவனமான ஆய்வின் போது வடக்கு குவியல் மற்றும் தெற்கு குவியலாக இரண்டு (02)பகுதிகளாக இனங்காண முடியுமெனவும் வடக்கு மற்றும் தெற்கு குவியல்கள் முறையே 40 மில்லியன் மெற்றிக் தொன்கள் மற்றும் 20 மில்லியன் மெற்றிக் தொன்கள் அளவிலான திரட்டுக்களையுடையது என பல்வெறு பரிசோதனை அறிக்கைகள் வெளிப்படுத்தியிருந்தது. (பின்னிணைப்பு 01)

6.1.1.2 மேலும் துளையிடல் - துவாரம் மாதிரி தரவுகளின் (bore - hole sampling data) பிரகாரம் குவியலின் 35 சதவீதம் அளவானவை நில மட்டத்திலிருந்து அதாவது 400 அடி உயர கோட்டுக்கு" (Contour line) மேல் அமைந்துள்ளது. அதற்கிணங்க வடக்கு குவியலில் 14 மில்லியன் மெற்றிக் தொன்னும் தெற்கு குவியலின் 07 மில்லியன் மெற்றிக் தொன் அளவானவையும் நில மட்டத்திற்கு மேல் அமைந்துள்ளது.

6.1.1.3 பொஸ்பேட் மூலப்பொருளாக நீண்டகால மற்றும் குறுங்கால பயிர்களுக்குத் தேவையான பசளை உற்பத்தி, கால்நடை உணவு உற்பத்தி மென்பானப் பொருள் உற்பத்தி, பல்வேறு இரசாயனப் பொருள் உற்பத்தி, செயற்கையான எலும்பு உற்பத்தி, மட்பாண்டப் பொருள் உற்பத்தி, மருந்து உற்பத்தி, வர்ணப் பூச்சு வகைகள் உற்பத்தி என்பவற்றிற்குப் பயன்படுத்தலாம் என இனங்காணப்பட்டிருந்தது.

6.2 எப்பாவல பொஸ்பேட் குவியலின் சிறப்பம்சங்கள்

6.2.1 எப்பாவல பொஸ்பேட் குவியலானது அபடைட் (Apatite) என்ற கனியப் பொருளின் பெயரில் அறிமுகப்படுத்தப்பட்டிருந்ததுடன் இதில் சாதாரண பொஸ்பரஸ் 33 சதவீதத்திலிருந்து 40 சதவீதம் வரையான அளவில் உள்ளடங்கியிருந்தது. இந்த பொஸ்பேட் குவியலானது ஏனைய நாடுகளில் அமைந்துள்ள இவ்வாறான குவியல்களை விட சிறப்பானதாக இருப்பதானது பொதுவாக பொஸ்பேட்களில் அடங்கியுள்ள கெட்மியம் (Cd) மற்றும் ஆசனிக் (As) இக்குவியல்களில் கருத்தில் கொள்ளப்படாத அளவு காணப்படுகின்றது என்பது இனங்காணப்பட்டுள்ளமையாகும். எனவே பங்களாதேசத்தில் அமைந்துள்ள சர்வதேச பசளை அபிவிருத்தி கூட்டுத்தாபனத்தின் (Interational Fertilizer Development Corporation) மூலம் இனங்காணப்பட்டுள்ள முறையில் இதில் கெட்மியம் உள்ளடக்கம் 0.0005% ஆகும். (பின்னிணைப்பு - 02)

6.2.2 மேலும், சிறுநீரக நோய்க்கு பிரபல்யமாக தாக்கமளிப்பதாக இனங்காணப்பட்டள்ள கெடிமியம் மற்றும் ஆசனிக் இறக்குமதி செய்யப்பட்ட இரசாயனப் பசளைகளில் அதிக அளவில் அடங்கியுள்ள போதிலும், எப்பாவல பொஸ்பேட்களில் அந்த இரசாயனம் மிகவும் குறைந்த அளவில் அடங்கியுள்ளது என வரையறுத்த இலங்கை பொஸ்பேட் கம்பனியால் (LPL) விவசாய அமைச்சிற்கு அனுப்பிவைக்கப்பட்டுள்ள தனித்த சுப்பர் பொஸ்பேட் (Single Super Phosphate) தயாரிக்கும் செயற்திட்ட அறிக்கையின் மூலம் உறுதிப்படுத்தப்பட்டுள்ளது. அவ்வாறே அந்த அறிக்கையில் விளக்கமளிக்கப்பட்ட முறைமையில் இக்குவியலானது உலகத்தில் இருக்கின்ற சிறந்த 10 பொஸ்பேட் குவியல்களுக்குள் அடங்குகின்றன. (பின்னிணைப்பு 02)

உருவப்படம் 01 - பொஸ்பேட் குவியலின் அமைவிடம்

6.3 வரையறுக்கப்பட்ட இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனி

6.3.1 கம்பனியை உருவாக்குதல்

1982 இன் 17 ஆம் இலக்க கம்பனிகள் அதிகாரச்சட்டத்தின் மூலம் 1992 யூலை 10 ஆந் திகதி வரையறுத்த இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனி உருவாக்கப்பட்டது.

6.3.2 கம்பனியின் தூரநோக்கு

எப்பாவல பொஸ்பேட் குவியலை சிறப்பாக பயன்படுத்தி ஊட்டச்சத்துள்ள பொஸ்பரஸ் மூலம் நமது தாய்நாட்டை வளமடையச் செய்தல்.

6.3.3 கம்பனியின் செயற்பணி

சுற்றாடலுக்கு சாதகமான மற்றும் புதிய நடைமுறையினூடாக பொஸ்பரஸ்களின் சுய தேவையை பூர்த்தி செய்து தேசிய பொஸ்பேட் தேவைப்பாட்டை நிறைவேற்றுதல்.

6.3.4 கம்பனியைத் தோற்றுவிக்கும் குறிக்கோள்

- 1957 இன் 49 ஆம் இலக்க அரசாங்க கைத்தொழில் கூட்டுத்தாபன அதிகாரச்சட்டத்தின் கீழ் வர்த்தமானி அறிவித்தலின் மூலம் வெளியிடப்பட்டு உருவாக்கப்பட்ட அரசாங்க சுரங்கங்கள் மற்றும் கனிய வளங்கள் அபிவிருத்தி கூட்டுத்தாபனத்தின் ஒரு பகுதியான எப்பாவல பொஸ்பேட் செயற்திட்டத்தின் செயற்பாடுகளைப் பொறுப்பேற்றல், செயற்படுத்துதல் மற்றும் நிறைவேற்றுதல்.

- மேலே குறிப்பிடப்பட்ட அரசாங்க சுரங்கம் தோண்டுதல் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாக பெயரிடப்பட்டுள்ள பகுதியினதும் அதன் மூலம் பயன்படுத்தப்படுகின்ற அசையும் மற்றும் அசையாத ஆதனங்கள் சம்பந்தமான உரிமையைப் பெற்றுக்கொள்ளல்.

- மேலே குறிப்பிடப்பட்ட அரசாங்க சுரங்கம் தோண்டுதல் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாகப் பெயரிடப்பட்டுள்ள பகுதியின் ஆதனங்களின் உள்ளே அல்லது வெளியிலிருந்து உருவாகின்ற அதிகாரங்கள் சலுகைகள், மற்றும் உரிமையாண்மைகளை உள்ளடக்கிய அனைத்து உரிமைகளையும் பெற்றுக்கொள்ளல்.

- மேற்கூறிய சுரங்கம் தோண்டுதல்கள் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாகப் பெயரிடப்பட்டுள்ள பகுதியின் அனைத்து பொறுப்புக்களையும் செலுத்தி தீர்த்தல்.

- மேற்கூறிய சுரங்கம் தோண்டுதல் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாகப் பெயரிடப்பட்ட பகுதி தொடர்பான அனைத்து புத்தகங்கள், கணக்குகள் மற்றும் ஆவணங்களைப் பெற்றுக்கொள்ளல் மற்றும் பராமரித்தல்.
- மேற்கூறிய அரசாங்க சுரங்கம் தோண்டுதல் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாகப் பெயரிடப்பட்ட பகுதியின் உத்தியோகத்தர்கள் ஊழியர்களுக்கு வேலைவாய்ப்புக்களை வழங்குதல்.
- மேற்கூறிய அரசாங்க சுரங்கம் தோண்டுதல் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாகப் பெயரிடப்பட்ட பகுதியின் வணிக நோக்கத்திற்காக கைச்சாத்திடப்பட்ட அனைத்து ஒப்பந்தங்களையும் உடன்படிக்கைகளையும் தொடர்ந்து மேற்கொள்ளுதல்.
- மேற்கூறிய அரசாங்க சுரங்க தோண்டுதல் மற்றும் கனிய வளங்கள் அபிவிருத்திக் கூட்டுத்தாபனத்தின் எப்பாவல பொஸ்பேட் செயற்திட்டமாகப் பெயரிடப்பட்ட பகுதியினால் அல்லது அதற்கு எதிராகத் தொடுக்கப்பட்ட அனைத்து நடவடிக்கைகள் மற்றும் விதிக்கப்பட்ட வழங்கு நடவடிக்கைகள் சம்பந்தமான அறிக்கைகளைப் பெற்றுக்கொள்ளல்.
- பொஸ்பேட் அல்லது அது சார்ந்த கனிய வளங்களை அகழ்தல், தரம்பிரித்தல், வடிகட்டல், முறைமைப்படுத்தல், செயன்முறைப்படுத்தல், மற்றும் தயாரித்தல் முயற்சிகளை மேற்கொள்ளல்.
- பொஸ்பேட் அல்லது அது சார்ந்த எதாவது கலப்பின் அல்லது அதிலிருந்தான மூலத்தின் ஏனைய தொடர்புபட்ட கனியப் பொருட்களின் அல்லது ஏதாவது உப பொருட்களின் வணிக அல்லது கைத்தொழில் பெறுமதிகளின் ஏதாவது உற்பத்திப் பொருட்களை உற்பத்தி செய்தல், தயாரித்தல், முன் விவரணம் செய்தல், கொள்வனவு செய்தல், களஞ்சியப்படுத்தல், சந்தைப்படுத்தல், விற்பனை செய்தல், இறக்குமதி செய்தல் அல்லது ஏற்றுமதி செய்தல்.
- பொஸ்பேட் அல்லது ஏனைய தொடர்புபட்ட கனியப் பொருட்களை அகழ்ந்தெடுத்தல், பிரித்தெடுத்தல், சுத்திகரித்தல், முறைமைப்படுத்துதல், செயன்முறைப்படுத்துதல், தயாரித்தல் மற்றும் உற்பத்தி செய்தல் முயற்சிகளை மேற்கொள்ளல்.

6.3.5 எப்பாவல பொஸ்பேட் குவியலின் அபிவிருத்திக்காக ஈடுபடுத்துவதற்கு கம்பனியினால் எடுக்கக்கூடிய நடவடிக்கைகள்

6.3.5.1 எப்பாவல பொஸ்பேட் குவியலின் அபிவிருத்திக்காக ஈடுபடுத்துவதற்கு கம்பனியினால் எடுக்ககூடிய நடவடிக்கைகள் கீழே தரப்படுகின்றன.

(i) நீண்டகாலப் பயிற்சிகளுக்காக பொஸ்பரஸ் தேவைப்பாட்டை நிறைவேற்றக்கூடிய பசளைகளை உற்பத்தி செய்து உள்நாட்டு தேவைப்பாடுகளை நிறைவேற்றிக் கொள்ளல்.

(ii) குறுங்கால பயிர்களுக்கான பொஸ்பரஸ் தேவைப்பாட்டை அடைந்து கொள்ளக்கூடிய பசளைகளை உற்பத்தி செய்து உள்நாட்டு தேவைப்பாடுகளை நிறைவேற்றிக் கொள்ளல்.

(iii) நீண்டகால மற்றும் குறுங்காலப் பயிர்களுக்காக பொஸ்பரஸ் தேவைப்பாட்டை நிறைவேற்றிக்கொள்ளக் கூடிய பசளைகளை உற்பத்தி செய்து ஏற்றுமதி செய்தல்.

(iv) பொஸ்பேட்களைப் பயன்படுத்தி உற்பத்தி செய்யக்கூடிய பல்வேறு உற்பத்திகளை மேற்கொள்ளல்.

6.3.5.2 வரையறத்த இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனியின் வேலைத்தளத்திலுள்ள உபகரணங்களைப் பயன்படுத்தி இறக்குமதி செய்த சல்பியுரிக் அமிலம் மற்றும் எப்பாவல பாறை பொஸ்பேட் (ERP) தேவையான இரசாயன நடைமுறைகளுக்குப் பயன்படுத்துவதன் மூலம் எப்பாவல தனித்த சுப்பர் பொஸ்பேட்டினை (Eppawala Single Super Phosphate) உற்பத்தி செய்யலாம் என 2006 ஆம் ஆண்டின் போது அப்போது பொஸ்பேட் அரசாங்க கம்பனியின் தலைவராகச் செயற்பட்ட பேராசிரியர் சந்தன பீ. உடவத்த அவர்களின் தலையீட்டில் இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனியால் பரிசோதனை செய்து சுட்டிக்காட்டப்பட்டிருந்தது. (பின்னிணைப்பு 03)

உருவப்படம் - 02







6.3.6 பொஸ்பேட் குவியலை அபிவிருத்தி செய்வதற்காக ஈடுபடுத்துவதற்கு கம்பனியின் வளங்கள்

(i) இலங்கை பொஸ்பேட் அரசாங்க கம்பனியில் போதிய அளவு மனித வளங்கள் காணப்படுகின்றமை. (பின்னிணைப்பு - 04)

